ජාතික චිත්‍රපට සංවධර්න අරමුදල - 2022

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 48 ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට මුළු භාණ්ඩාගාර බිල්පත් රු.27,425,701 ක් හා ඉදිරි වර්ෂය සඳහා භාණ්ඩාගාර බිල්පත් පොලී ලැබීම් රු. 454,444 ක් එකිනෙකට හිලව් කර ශුද්ධ වටිනාකම වූ රු. 26,971,257 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදිව සටහන් කරමි. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 76 ඡේදය ප්‍රකාරව, වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකරන වත්කම්, ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවද, 2024 වර්ෂයේ ගෙවීම් ආරම්භ කර 2026 වර්ෂයේ ගෙවා අවසන් කළ යුතු, සමාලෝචිත වර්ෂයේදී සිනමා ශාලාවකට ලබාදුන් රු.300,000 ක ණයගැති ශේෂය ජංගම වත්කම් යටතේ වර්ගීකරණය කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදිව සටහන් කරමි. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 22 හා 27 (ආ) ඡේද ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම් යටතේ දැක්විය යුතු ණයගැති වෙනස්වීම රු.873,425 ක් හා ලැබිය යුතු මුදල් වෙනස්වීම රු.1,972,244 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වර්ග කර දක්වා තිබුණි. | 2023 සිට කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම යටතේ දක්වනු ලැබේ. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 92 ඡේදය ප්‍රකාරව තාවකාලිකව අක්‍රීයව ඇති හෝ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන හෝ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති සහ බැහැර කිරීම සඳහා තබා ඇති සේ වර්ගීකරණය කළ දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් 2022 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 567,732 ක් වූ ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටරය සහ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය සම්බන්ධයෙන් එසේ හෙළිදරව් කර නොතිබුණු අතර එම වත්කම්වල පැවැත්මද තහවුරු නොකරන ලදී. | 2023 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී තොරතුරු හඳුනාගැනීමට කටයුතු කරමි. ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටරය සහ මල්ටිමීඩියා යන්ත්‍රය ක්‍රියාවිරහිතවීම නිසා මේ වන විට ගිණුම් පොත්වලින් ඉවත්කර ඇත . | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂයේ ආරම්භක ශේෂයන්ට ගැලපීම් කළ යුතු 2021 දෙසැම්බර් 09 දින රු.3,200,000 කට ප්‍රත්‍යාගණනය කරන ලද GB – 1371 දරන Mitsubishi L 300 වෑන් රථයේ වටිනාකම 2022 වර්ෂයේදී ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෝටර් රථ ගිණුමේ හා ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් රු.3,200,000 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණු අතර එම වෑන් රථය සඳහා 2021 වර්ෂයට අදාළ රු.50,441 ක් වූ ක්ෂය ගැලපීම් ද සිදු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. 2022 වත්කම් ප්‍රත්‍යාගණනය කර ආරම්භක ශේෂයට නොගැලපුවද වර්ෂයේ අවසානයට එකතු කර ගිණුම් සටහන් යොදා ඇත. 2021 වර්ෂයේ ශුද්ධ අගය ලෙස දක්වා ඇත්තේ රු. 1/= ලෙසටය. 2022 වර්ෂයේදී නැවත ප්‍රත්‍යාගණනය වටිනාකම එකතු කර ක්ෂය කර ඇත. | නිවැරදිව ක්ෂය ගැලපීම් සිදු කළ යුතුය . |

| | | |
|---|---|---|
| (ආ)වැකන්ද වලව්ව හා නිසලගිර චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ආදායමින් අරමුදලට ලැබිය යුතු ගාස්තු රු. 3,532,156 ක් හිඟහිටි කාලය 2022 දෙසැම්බර් 31 දිනට වසර 05 ක් ඉක්මවා තිබුණ ද, එම මුදල් අයකර ගැනීමට හෝ ඒ සඳහා වෙන්කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | සිනමාශාලා නවීන තාක්ෂණයෙන් ප්‍රක්ෂේපණ කටයුතු සිදුකරන බැවින් 35mm සිනමා ප්‍රදර්ශනය කරවීමේ අවස්ථා අහිමි වී ඇත. මෙම චිත්‍රපට 35mm සිනමාපට බැවින් නැවත ප්‍රදර්ශනය කරවා ණය අයකර ගැනීමේ හැකියාව අහිමි වී ඇත. මෙම මුදල සකස්වී ඇත්තේ ප්‍රදර්ශිත ආදායම අයකර ගැනීමෙන් පසු බවද දන්වා සිටිමි. | අරමුදලට ලැබිය යුතු මුදල අයකර ගැනීමට හෝ ඒ සඳහා වෙන්කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාතර්ා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| චිත්‍රපට නිෂ්පාදන වියදම | 1,360,404 | 1,457,772 | 97,368 | උපලේඛනය සකස් කිරීමේදී සිදුවූ වැරැද්දකි . | උපලේඛන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදන ණය, සිනමාශාලා ණය හා කොවිඩ් - 19 සිනමාශාලා ණය රු.72,236,299 ක් සහ වැකන්ද වලව්ව හා නිසලගිර චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ආදායමින් ලැබියයුතු රු.3,532,156 ක් වශයෙන් එකතුව රු. 75,768,455 ක ශේෂයෙන් වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.74,786,010 ක් වූ අතර කර්මාන්තය බිඳ වැටීම, කළමනාකරණය ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම යන තත්ත්වයන් මත එම මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි. ලැබිය යුතු ණය ශේෂය වූ රු.72,236,299 කින් සියයට 92 ක් වූ රු.67,222,372 ක් අඩමාණ ණය වශයෙන් වෙන්කිරීම් සිදු කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | හිඟ හිටි පැරණි ණය ශේෂ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2020 ජූලි 21 දිනැති අංක 53 - 01 දරන පාලක මණ්ඩල තීරණය අනුව කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සිනමාශාලා 02 කට රු.300,000 ක් බැගින් ලබාදී තිබුණු ණය මුදල, ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2024 මාර්තු 18 දිනට තවදුරටත් සිනමාශාලා 02 කින් අයවිය යුතු ණය මුදල් රු.249,087 ක් අයනොවී පැවතුණු අතර අවසන් වී තිබුණු ණය ගිවිසුම්වල කාලය දීර්ඝ කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | රූ සිනමාහල -කටුනායක සිනමා ශාලාවෙන් 2023.12.31 දිනට අයවිය යුතු රු.131,577.50 ක මුදලින් රු. 64,785.75 ක මුදලක් 2024 පෙබරවාරි මස ගෙවා ඇත. නහම්ස් - චුන්නාගම් සිනමාශාලාවෙන් මුදල් ගෙවන ලෙස ලිඛිතව සහ දුරකථනයෙන් දැනුවත් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව ණය අයකර ගැනීමටත් අවසන් වී ඇති ණය ගිවිසුම්වල කාලය දීර්ඝ කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන්, අරමුදලට ලැබිය යුතු කුලී දායකත්වය රු. 29,140,411 කින් 2024 මාර්තු වන විට රු.24,140,411 ක් තවදුරටත් හිඟහිටව තිබුණි. | 2023 වර්ෂයේදී රු. මිලියන 05 මුදලක් ලබාගන්නා ලද අතර ඉදිරියේදී කොටස් වශයෙන් ලබා ගැනීමට කටයුතු කරමි. | සංස්ථාවෙන් ලැබිය යුතු කුලී මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝග | | | |
| i. නියෝග අංක (4) (අ) | චිත්‍රපට කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සැපයීමටත් සහ දේශීය වශයෙන් චිත්‍රපට නිෂ්පාදනය කිරීම සඳහා උරදීම හා ආධාර අනුබල දීමටත් කටයුතු කර නොතිබුණි. | මණ්ඩල පත්කිරීම් ප්‍රමාදවීම හේතුවෙන් ඔබ විසින් පෙන්වාදී ඇති කරුණු සඳහා ඵලදායී ක්‍රියාවලියක් සිදුවී නොමැත. ඉදිරියේදී පෙන්වාදී ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරමි. | පාලක මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා නියෝග ක්‍රියාත්මක කිරීමට නිසි පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | නියෝග අංක (4) (ආ) | නරඹන්නන්ගේ සහ සිනමා ශාලාවල සේවකයන්ගේ පහසුව හා ප්‍රවේශය සඳහා අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් සිනමාශාලාව විසින් සපයන බවට සහතික කර නොතිබුණි. | එම | පාලක මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා නියෝග ක්‍රියාත්මක කිරීමට නිසි පියවර ගත යුතුය. |
| iii. | නියෝග අංක (4) (ඇ) | සිනමා කර්මාන්තයෙහි අනෙකුත් අංශයන්හි වැඩි දියුණුව ඇති කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | එම | පාලක මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා සිනමා කර්මාන්තයෙහි වැඩි දියුණුව ඇති කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| iv. | 2 (4) (I) (ඉ) වගන්තිය | චිත්‍රපටවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා, චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීමට කටයුතු කර නොතිබුණි. | එම | නියෝගය ප්‍රකාරව චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීමට කටයුතු කළ යුතුය. |
| v. | 2 (4) (I) (උ) වගන්තිය | උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබා ගැනීම පිණිස අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මගින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | එම | නියෝග ක්‍රියාත්මක කිරීමට නිසි පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| vi. 2(4)(I)(ඌ) වගන්තිය | වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක එම කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | නියෝග ක්‍රියාත්මක කිරීමට නිසි පියවර ගත යුතුය. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අරමුදල විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 12,976,126 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,000,099 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,976,027 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ආයතන හා පරිපාලන වියදම් රු. 1,283,722 කින් වැඩිවී තිබුණද ඊට සාපේක්ෂව රු.10,259,749 කින් අරමුදලේ අදායම් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝගයන් යටතේ වූ කාර්යයන් ක්‍රියාවට නැංවීමේදී එම එක් එක් කාර්යයට අදාළව වෙන් වෙන්ව සකස් කරන ලද රීති මාලාවක් හෝ කාර්ය පටිපාටීන් තිබිය යුතු වුවත් අරමුදල විසින් එවැනි රීති මාලාවක් හෝ කාර්ය පටිපාටීන් සකස් කර නොතිබුණු බැවින් අරමුදල විසින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් පිළිබඳ නිසි ඇගයීමක් සිදු කළ නොහැකි විය. | චිත්‍රපට සංවර්ධන අරමුදල ආරම්භයේදී ගැසට් පත්‍රිකාවේ සඳහන් රීති මාලාවක් තිබුණද එක් එක් අවස්ථාවල පත්වන පාලක මණ්ඩල සාමාජිකයින්ගේ උපදෙස් අනුව ක්‍රියාකර ඇති අතර ඉදිරියේදී නව නීති අනුව කටයුතු කිරීමට ගැසට් පත්‍රය සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. | අරමුදල විසින් ක්‍රියාවට නංවනු ලබන කාර්යයන්ට අදාළව රීති මාලාවක් හෝ කාර්ය පටිපාටීන් සකස් කිරීමට හා ගැසට් පත්‍රය සංශෝධනය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අරමුදලේ සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.12,832,242 ක් වන විට අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ නියෝග අංක 02 ප්‍රකාරව චිත්‍රපට කර්මාන්තය තුළින් උපයා ගෙන තිබුණු ආදායම රු.1,972,244 ක් තරම් අවම මට්ටමක පැවතුණි. චිත්‍රපට කර්මාන්තයේ බිඳ වැටීමත්, එම කර්මාන්තය නඟා සිටුවීමට කටයුතු නොකර මුදල් ආයෝජනය කිරීම පමණක් සිදුකර තිබීමත් මෙම තත්ත්වයට හේතුවී තිබුණි. | අමාත්‍යාංශ මාරුවීම මත පාලක මණ්ඩල පත්කිරීම ප්‍රමාදවිය. එම හේතුවෙන් කර්මාන්තය නඟා සිටුවීමට තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම ගැටළුවක් වී ඇත. මේ වන විට නව නීතිය අනුව ගැසට් පත්‍රය සංශෝධනය කරනු ඇත. නව ගැසට් පත්‍රය අනුව කර්මාන්තය නඟා සිටුවීමට මුදල් ආයෝජනය කරනු තුරු වැඩිම පොලියක් ලැබෙන සේ තැන්පතු වල මුදල් ආයෝජනය කර වැඩි පොලී මුදලක් ලබා ගෙන ඇත. | නව නීතිය අනුව ගැසට් පත්‍රය සංශෝධනය කර කර්මාන්තය නඟා සිටුවීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 1996 ඔක්තෝම්බර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝගයන්හි පාලක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු ආකාරය පිළිබඳව සඳහන් කර නොතිබීමෙන් 2022 වර්ෂය තුළ එක් පාලක මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණු අතර පෙර වර්ෂයන්හි තත්ත්වය ද ඒ ආකාරයෙන්ම විය. ඒ අනුව, චිත්‍රපට කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණ ද පාලක මණ්ඩලය විසින් සිනමා කර්මාන්තයේ උන්නතිය උදෙසා සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශ මාරුවීම මත පාලක මණ්ඩල පත්කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කර්මාන්තයේ උන්නතිය උදෙසා කටයුතු කිරීමට නොහැකි වුවද ඉදිරියේදී එම කටයුතු සාර්ථක කර ගැනීමට කටයුතු කරනු ඇත. | පාලක මණ්ඩල රැස්වීම් නිසි ලෙස පවත්වා සංශෝධිත නියෝග ප්‍රකාරව කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොරියානු චුන්ග් අන්ග් (CHUNG – ANG University) විශ්වවිද්‍යාලයෙන් “PHD in Film & Multimedia – Film & Media Production” උපාධිය හැදෑරීම සඳහා අවම වශයෙන් රු.51,916,665 ක් පමණ වැයවනු ඇති බවට චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් පදනම් කර ගනිමින් වෙනත් කිසිදු සාක්ෂියකින් තොරව 2022 මාර්තු 31 දිනැති පාලක | මොහු සංස්ථාවේ ඩිප්ලෝමාධාරියෙකු වශයෙන් ක්ෂේත්‍රයට පිවිසී තිබුණු අතර ක්ෂේත්‍රයේ මෙලෙස පශ්චාත් උපාධියක් ලබාගත් අයෙකු මින් පෙර නොමැති බවත් ඒ යන වියදම පිළිබඳව පාලක මණ්ඩල රැස්වීමේදී ගනුලැබූ තීරණයක් මත ගෙවීම් කර ඇති අතර දිගින් දිගටම ක්ෂේත්‍රයේ රැඳෙනු ඇතැයි අපේක්ෂා කරමින් මෙම ශිෂ්‍යත්ව ලබාදී ඇත. ඔහු එය හදාරන ක්ෂේත්‍රයේ බවට ප්‍රතිඵල | මූල්‍ය ප්‍රදානයන් කිරීමේදී වැයකළ මුදලේ ප්‍රතිලාභය ක්ෂේත්‍රයට ලබා ගැනීමට හැකි වන පරිදි පාලක මණ්ඩලය විසින් අරමුදලේ නියෝග ප්‍රකාරව, නියමයන් |

| | | |
|---|---|---|
| මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය මත රු.1,000,000 ක මූල්‍යමය අනුග්‍රහයක් ලබාදී තිබුණු අතර එම මුදල අදාළ විශ්වවිද්‍යාලයට ගෙවූ බවට සනාථ කර නොතිබුණි. තවද, ස්ථාවර නියෝග අංක 4 (ඊ) ප්‍රකාරව, පාලක මණ්ඩලය විසින් කිසිදු නියමයක් හෝ කොන්දේසියක් නිශ්චය කර නොගෙන මෙම මූල්‍ය ප්‍රදානය සිදු කර තිබුණි. | ලේඛනයද ඉදිරිපත් කර ඇත. මොහු ජාත්‍යන්තර සම්මානලාභී අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කීර්තියක් ලබා දී ඇත. | හෝ කොන්දේසි නිශ්චය කළ යුතුය. |

## 4 . ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 877(2) (ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 09 ක ප්‍රමාදයකින් පසුව 2023 දෙසැම්බර් 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2022.12.31 දිනට අවසන් ගිණුම් 2023 පෙබරවාරි මස අවසන් වනවිට පිළියෙල කර තිබුණද අමාත්‍යාංශ මාරුවීම මත පාලක මණ්ඩලය පත්කිරීම ප්‍රමාදවීම හේතුවෙන් අවසන් ගිණුම්වලට පාලක මණ්ඩලය අනුමැතිය ලබාගැනීම ප්‍රමාදය මෙයට හේතු වේ. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| ජාතික විගණන පනතේ 38 (ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් හෝ ගණන්දීමේ නිලධාරියා විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් ආරම්භයේ සිටම අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | ජාතික විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 877(1) (ඇ) සහ (ඈ) ප්‍රකාරව කිසියම් අරමුදලක පාලනාධිකාරිය විසින් වාර්ෂිකව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය එම අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙල කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු වුවද අරමුදල විසින් 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර ගැනීමකින් තොරව අරමුදලේ වියදම් දරා තිබුණි. | ඒ සඳහා තීරණ ගැනීමට පාලක මණ්ඩලය රැස්කරවා ගත නොහැකි වූ අතර අවසන් රැස්වීම සඳහා මුදල් අයවැයක් සකස් කර ඉදිරිපත් කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් පරිදි කටයුතු නිම කිරීමට නව නීති මාලාවක් සකස්කළ යුතු බව මූලිකව අවධාරණය විය . | අරමුදලේ අරමුණු වලට අනුකූලව අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර අනුමත අයවැයකින් තොරව වියදම් නොදැරිය යුතුය. |